**පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව - 2023**

------------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්වාගණනයකළ මතය

පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, නියාමන සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියාමන සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය නියාමන සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියාමන සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, නියාමන සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියාමන සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියාමන සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියාමන සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියාමන සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදි ලැබී තිබුණු රු.2,117,565 ක ලියාපදිංචි ගාස්තු ආදායම නිශ්චිතව හදුනාගෙන ගිණුම් ගත නොකර මූල්‍ය ප්‍රකාශනවල හඳුනා නොගත් ආදායම් ලෙස දක්වා තිබුණි. | අනාගතයේදී මෙම ගැටළු විසඳීම සඳහා සභාව ගිණුම්කරණ මෘදුකාංග සහ මාර්ගගත ලියාපදිංචි කිරීමේ පද්ධති හඳුන්වා දී ඇති බව. | ලියාපදිංචි ගාස්තු ආදායම නිශ්චිතව හදුනාගෙන ගිණුම් ගතකළ යුතුය. |
| (ආ) | ඉකුත් වර්ෂ වලදී උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබුණු එකතු වටිනාකම රු.494,198 ක් වූ ගෙවීම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම් ගත කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර එම මුදල පූර්ව වර්ෂ ගැලපීම් යටතේ දක්වා නොතිබුණි | නියාමන සභාවේ ලේකම් සේවා සඳහා ගෙවීම ඉල්ලීම් දිගු කලකින් නොලැබීමේ ප්‍රතිඵලයක් වශයෙන් මෙම තත්ත්වය උද්ගත වූ බව. | කාලපරිච්ඡේදයට අදාළ වියදම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | ගිණුම් තුළනය නොවීම මත පැන නැගී තිබුණු රු.232,400 ක අවිනිශ්චිත ශේෂය හඳුනාගෙන අවශ්‍ය | එම ගැටලුව නිවැරැදි කිරීමට පියවර ගෙන ඇති බව. | අවිනිශ්චිත ගිණුම් ශේෂය හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් සිදුකල යුතුය. |

ගැලපීම් සිදු කරනු වෙනුවට අරමුදල් මාරු ගිණුමේ ශේෂයක් ලෙස දක්වා තිබුණි.

### 1.5.2 සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2023 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ජංගම වත්කම්වල රු48,438,734 ක සෘණ ශේෂයක් පැවති බැවින් නියාමන සභාවේ කෙටිකාලීන බුන්වත්භාවයක් පවතින බව නිරීක්ෂණය විය. එසේම 2017 වර්ෂයේ සිට නියාමන සභාව අඛණ්ඩව අලාභ ලැබීම හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවැති රු.33,719,154 ක සමුච්චිත අරමුදල 2023 දෙසැම්බර් 31 දින වන විට රු.10,371,883 ක් දක්වා සියයට 68 කින් ක්‍රමයෙන් අඩුවී තිබුණි. | මෙම තත්ත්වය අවම කිරීමට සහ ජය ගැනීමට කඩිනම් පියවර ගැනීමට තීරණය කර ඇති බව, ලියාපදිංචි ගාස්තු 2024 සිට සියයට 50 කින් වැඩි කිරීමට, දඩ සහ දඩ ගාස්තු ක්‍රියාත්මක කිරීමට, ලියාපදිංචිය වැඩි කර ගැනීමට, පනත යටතේ බලයලත් නිලධාරියාගේ විෂය පථය පුළුල් කිරීමට, පළාත් අධ්‍යක්ෂවරුන් විසින් ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට, විද්‍යුත් ලියාපදිංචි කිරීමේ පද්ධති හඳුන්වා දීමට සහ පිරිවැය අඩු කිරීම සඳහා පියවර ගැනීමට කටයුතු කරන බව. | රට තුළ ක්‍රියාත්මක සියලුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කර ආදායම වැඩි කර ගැනීමටත් ආයතනයේ වියදම් අවම කර ගැනීමටත් කටයුතු කරමින් කෙටිකාලීන බුන්වත්භාවයෙන් මිදීමටත් අඛණ්ඩව අලාභ ලැබීම අවම කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- | --- | --- |
| | | රු. | | | |
| (අ) | දේපල පිරියත හා උපකරණ හා ඉන්වෙන්ට්‍රි අයිතම | 3,255,035 | විස්තරාත්මක උපලේඛන | 2007 වසරේ සිට දේපල පිරියත හා උපකරණ සඳහා නිසි පොත් නඩත්තු කර නොතිබුණු බව, කෙසේ වෙතත්, 2018 සිට නිවැරදි කිරීමේ | විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | |
| (ආ) | වියදම් | 2,826,544 | මුදල් භාරගැනීමේ කුවිතාන්සි හෝ අදාළ වියදම තහවුරු කෙරෙන ලිඛිත සාක්ෂි | අදාළ වියදම් ලේඛන පරීක්ෂාව සඳහා ඉදිරිපත් කරන බව. | මෙම සියළුම තොරතුරු කඩිනමින් විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 11 දිනැති අංක PED 04/2023 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | 2022 මූල්‍ය වර්ෂය තුළදී අලාභ තත්ත්වයන් වාර්තා කර ඇති ආයතනයක සේවකයන්ට ප්‍රසාද දීමනාවන් ගෙවිය නොහැකි වුවද, ඊට අනුකූල නොවන පරිදි නියාමන සභාව 2022 වර්ෂයේදි රු. 5,372,457 ක අලාභයක් ලබා තිබියදි සමාලෝචිත වර්ෂය තුළදී රු.525,000 ක් ප්‍රසාද දීමනා ලෙස ගෙවා තිබුණි. | නියාමන සභාව අවම සේවක සංඛ්‍යාවකින් ක්‍රියාත්මක කිරීම, සේවක අභිප්‍රේරණය, හා නිවාඩු අඩු කිරීම සඳහා ප්‍රසාද දීමනාව අනුමත කළ බව. | චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොත | | | |
| | i. 3.1 ඡේදය | කාර්යමණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවත් නියාමන සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙය මහා භාණ්ඩාගාරයේ ලියාපදිංචි නොකිරීමට සභාව ගත් ප්‍රතිපත්තිමය තීරණයක් බව. | මෙහෙයුම් අත්පොතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| | ii. 6.6 ඡේදය | විගණන වාර්තාව සමග වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඇතුළත් වාර්ෂික වාර්තාව මූල්‍ය වර්ෂය අවසන් වීමෙන් පසු මාස 05 ක් | 2023 වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමට දැනටමත් පියවර ගෙන ඇති බව. | මෙහෙයුම් අත්පොතේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද, නියාමන සභාව විසින් 2021 හා 2022 වාර්ෂික වාර්තා 2024 මාර්තු 25 දින දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. | | |
| (ඇ) | 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය 2.3 ඡේදය | උපාය මාර්ගික සැලැස්මක්, ක්‍රියාකාරී සැලැස්මක් හා වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර පාලක මණ්ඩලය විසින් අනුමත කළ යුතු අතර එ්වා රේඛීය අමාත්‍යාංශ ලේකම්වරයා මාර්ගයෙන් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | 2024 සිට නිවැරදි ක්‍රියාමාර්ග ගනු ලබන බව, භාණ්ඩාගාරයේ ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මූලික සාකච්ඡාවක් පවත්වන ලද බව. | මාර්ගෝපදේශ සංග්‍රහයේ දක්වා ඇති විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | 2015ජුලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (5) | තත්කාර්ය අතුරු අග්‍රිම ඒවා ලබාගත් කාර්යය නිමකළ වහාම සහ දින 10 ක් ඇතුළත පියවිය යුතු වුවද,2023 වර්ෂයේ ලබාගත් රු.3,529,800 ක තත්කාර්ය අතුරු අග්‍රිම 53 කින් විගණනයට ලක්කරන ලද රු.1,060,300 ක අතුරු අග්‍රිම 11 ක් පියවීමට දින 10 ත් දින 25 ත් අතර කාලයක් ගත කර තිබුණි. මින් අවස්ථා 9 ක වියදම් දැරීමෙන් පසුව ඉතිරි මුදල ලබා ගත් අත්තිකාරම් මුදලින් සියයට 50 ත් 89 ත් අතර විය. තවද, අදාළ කාර්යය ආරම්භයට දින 5 ත් දින 36 ත් අතර කාලයකට පෙර එකතුව රු.1,679,300 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 23 ක් නිකුත්කර තිබුණි | අනාගතයේදී මේ අනුව කටයුතු කරන බව | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය756 | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි | තොග සත්‍යාපනය 2023 වර්ෂය තුළ සිදු නොකළ බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,504,684 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පාඩුව රු. 5,372,457 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.6,877,141 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ලියාපදිංචි ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ පනතේ 2(1) උප වගන්තියේ විධිවිධාන ප්‍රකාරව, සියළුම පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි විය යුතු අතර ලියාපදිංචි විය යුතු පෞද්ගලික වෛද්‍ය ආයතන හඳුනාගැනීමට, ලියාපදිංචි කරවීමට හා ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට විධිමත් ක්‍රමවේදයක් නියාමන සභාව විසින් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. | දත්ත සමුදාය සහ සමීක්ෂණය මත පදනම්ව ලියාපදිංචි නොකළ පෞද්ගලික වෛද්‍ය ආයතන හඳුනාගෙන ඇති බව, ලියාපදිංචි නොකරන ලද ආයතන වෙත දැනුම්දීම් ලිපි යැවීම, භාෂා තුනකින් පුවත්පත් දැන්වීම් පළ කිරීම, ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නීති උපදේශකවරයා සමඟ සාකච්ඡා කිරීම, බලයලත් නිලධාරියා සහ නඩු පවරන නිලධාරීන් පත් කිරීම හා ලියාපදිංචි නොකළ ආයතන හඳුනා ගැනීම සම්බන්ධයෙන් පොලිස්පතිවරයා සමඟ සාකච්ඡා කිරීම සිදුකළ බව. | සභාවේ ලියාපදිංචි විය යුතු වෛද්‍ය ආයතන හඳුනාගැනීමටත්, ලියාපදිංචි නොවන ආයතන සම්බන්ධයෙන් පනතේ 4 වන වගන්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමටත් විධිමත් ක්‍රමවේදයක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ ) පනතේ 13(1) වන වගන්තිය අනුව සභාවේ උපදෙස් මත ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, පෞද්ගලික වෛද්‍ය ආයතන සඳහා ප්‍රතීතනය කිරීමේ යෝජනා ක්‍රමයක් ක්‍රමවත්ව දක්වා ක්‍රියාවේ යොදනු ලැබිය යුතු බවත්, ප්‍රතීතනය සඳහා වූ නිර්ණායක, සංයුක්ත වන පහසුකම්, සේවා සහ වෙනත් යම් සාධක නිශ්චිතව දැක්වෙන සියලු විස්තර ඒ නියමයෙහි ඇතුළත් විය යුතු බවත් දක්වා තිබුණද, 2023 දෙසැම්බර් 31 දින වන විටත් මෙම ප්‍රතීතන කටයුතු සම්බන්ධව නියෝග සකස් කර නීතියක් බවට පත් කර නොතිබුණි. | අනාගතයේදී සලකා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව | එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ ) පනතේ 18(2)(උ) වගන්තිය අනුව “සම්බන්ධතාවක් දක්වන හෝ අතෘප්තියට පත් තැනැත්තකු විසින් යම් පෞද්ගලික වෛද්‍ය ආයතනයකට හෝ එයට සම්බන්ධ තැනැත්තකුට විරුද්ධව ඉදිරිපත් කරනු ලබන යම් පැමිණිල්ලක් භාරගැනීමේදී හා එම පැමිණිල්ල අවසාන වශයෙන් බැහැර කිරීමේදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හෝ පරිචය” සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි වුවත්, අමාත්‍යවරයා විසින් මෙම කරුණ සම්බන්ධයෙන් නියෝග සකස් කර නොතිබුණ අතර පෞද්ගලික සෞඛ්‍ය සේවා නියාමන සභාව විසින් PHSRC Guideline 05-Complain Handling Procedure නමින් 2021 මාර්තු 19 දින පිටු 02 කින් යුක්තවූ (කරුණු 12 ක් ඇතුළත් වූ) පැමිණිලි සම්බන්ධව මාර්ගෝපදේශයක් පමණක් පිළියෙල කර තිබුණි. | නියාමන සභාව විසින් පැමිණිලි හැසිරවීමේ ක්‍රියා පටිපාටි සඳහා මාර්ගෝපදේශයක් සකස් කර ගරු සෞඛ්‍ය ඇමැති තුමා වෙත ඉදිරිපත් කර ඇති බව | එම පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අදායම තුළ, 2012 සිට 2022 වර්ෂය තෙක් පූර්ව වර්ෂ වෙනුවෙන් ලද රු. 4,078,250 ක් හෙවත් මුළු ආදායමින් සියයට 13 ක් පමණ වූ ආදායමක් ඇතුළත් විය. වාර්ෂික ලියාපදිංචිය ලබාගත යුතු නිශ්චිත කාල වකවානුවක් පනතේ හෝ නියමු උපදේශන මගින් සඳහන් කර නොතිබීම හේතුවෙන් වෛද්‍ය ආයතන ලියාපදිංචිය වෙනුවෙන් කවර දිනක හෝ මුදල් ලද පසු අදාළ වර්ෂය සඳහා ලියාපදිංචි සහතික නිකුත් කිරීම සිදු කර තිබුණු අතර දඩ මුදලක් අයකර නොතිබීම හේතුවෙන් වර්ෂය මුලදී සභාවට ලැබිය යුතු ආදායම ප්‍රමාදවී ලැබී තිබුණි. | නියමිත වේලාවට ලියාපදිංචි කිරීමට නියාමන සභාව පියවර කිහිපයක් ගෙන ඇති බව, ලියාපදිංචි නොකළ ආයතනවලට එරෙහිව නීතිමය පියවර ගැනීමට, දඩ සහ දඩ ගාස්තු ක්‍රියාත්මක කිරීමට හා විද්‍යුත් ලියාපදිංචි කිරීමේ පද්ධති හඳුන්වා දීමට කටයුතු කරන බව. | නියමිත කාලය තුළ වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවය කරන වෛද්‍ය නිලධාරින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ ලියාපදිංචි වූ වෛද්‍යවරුන් වුවත්, පෞද්ගලික වෛද්‍ය ආයතනවල සේවය කරන හෙද අතුරු වෛද්‍ය හා පරිපූරක වෛද්‍ය සේවාවන්ට අයත් සේවකයින් සම්බන්ධයෙන් ප්‍රමිතීන් හෝ නිර්ණායකයන් නියාමන සභාව විසින් ප්‍රකාශයට පත්කර නොමැති බවත්, මේ සම්බන්ධයෙන් තම වගකීම ඉටුකර නොමැති බවත් විගණනයේදී නිරීක්ෂණය විය. මෙම සේවාවන් සම්බන්ධයෙන් විධිමත් ප්‍රමිතීන් හෝ නිර්ණායකයන් හඳුන්වා නොදී හා මෙම සේවාවන්වල සේවයේ නියුක්ත කර ඇති සේවකයින්ගේ වෘත්තීය සුදුසුකම් සම්බන්ධයෙන් නිසි තක්සේරුවක් රහිතව පෞද්ගලික වෛද්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම තුළ නියාමන සභාව වගකීමට බැඳෙන බව නිරීක්ෂණය විය. | මෙම කරුණු සභා රැස්වීමේදී සාකච්ඡා කර පියවර ගත් බව.විගණන නිරීක්ෂණය සමඟ එකඟ වන බව | පෞද්ගලික වෛද්‍ය ආයතන විසින් සේවක පිරිස් බඳවා ගැනීම්වලදී අවම සුදුසුකම් අනුගමනය කරන බවට සහතිකවීම හා සේවක පිරිස් පුහුණු කිරීමේදී අවම ප්‍රමිතීන් අනුගමනය කරන බවට වගබලා ගැනීම සඳහා පනත මඟින් ලැබී ඇති නියාමන කාර්යය විධිමත් පරිදි ක්‍රියාත්මක කළ යුතුය. පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය |
| (ඇ) | පනතේ 11 වන වගන්තිය අනුව “ සභාව විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවලදි මේ පනත යටතේ සභාවේ කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටු කිරීම, සභාවේ යම් සමාජිකයෙකුට හෝ සමාජිකයන්ට හෝ සභාවේ | පුහුණු කමිටුව විසින් හිටපු හෙද අධ්‍යක්ෂවරිය අනුකමිටුවේ නිරීක්ෂකයෙකු ලෙස පත් කරනු ලැබුවේ | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සමාජිකයන්ගෙන් සමන්විත වන කමිටුවක් වෙත හෝ පවරනු ලැබිය හැකි අතර, එසේ පවරනු ලැබූ සාමාජිකයා, සමාජිකයින් හෝ කමිටුව විසින් සභාවේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව එම කාර්ය කිරීම සහ කර්තව්‍ය ඉටුකිරීම කළ යුතුය'' ලෙස දැක්වේ. මේ අනුව අනුකමිටුවලට නියාමන සභාවේ පාලක මණ්ඩල සමාජිකයින් නොවන තැනැත්තන් පත් කිරීමට අධිකාරී බලයක් ලැබී නොමැති වුවත් පුහුණු අනු කමිටුව සඳහා 2017 වර්ෂයේ සිට නිරීක්ෂකයකු ලෙස නිලධාරීනියක් පත්කර තිබුණි. | ඇයගේ විශේෂඥතාවයෙන් අවබෝධයක් ලබා ගැනීමට බව. | |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 අභ්‍යන්තර විගණනය**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.4 ඡේදය අනුව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වුවද නියාමන සභාව ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මීළඟ සභා රැස්වීමේදී මෙම ගැටළුව සම්බන්ධයෙන් සාකච්ඡා කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**4.2 විගණන කමිටුව**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක ඩීඑම්ඒ/1-2019 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව, කාර්තුවකට 01 බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 04 ක් පැවැත්විය යුතු වුවද, නියාමන සභාව විසින් සමාලෝචිත වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි. | මාර්ගෝපදේශයට අනුව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 2024 දී පැවැත්වීමට කටයුතු කරන බව. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4.3 තිරසාර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කර තිබුණු චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව නියාමන සභාව විසින් දැනුවත් වී නොතිබීම හේතුවෙන් තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. මෙම තත්ත්වය පසුගිය වර්ෂ 06 කදි පෙන්වා දුන්නද වගකිව යුතු පාර්ශවයන් ඒ සම්බන්ධයෙන් අවධානය යොමුකර නොතිබුණි | මේ අනුව ඉදිරියේදී කටයුතු කරන බව. | අදාළ චක්‍රලේඛය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” පිළිබඳව නියාමන සභාව දැනුවත්වී තම විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟාවිය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගැනීමට කටයුතු කළ යුතුය. |